## <u>බස්නාහිර පළාත් සභාව යටතේ සේවයේ නියුතු ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය</u>

1. මෙම ස්ථාන මාරු පරිපාටිය බස්නාහිර පළාත් සභාව යටතේ සේවයේ නියුතු ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරීන්, බස්නාහිර පළාත් සභාව තුළ සේවා ස්ථාන අතර ස්ථාන මාරු කිරීම සඳහා අදාළ වේ.

2. උක්ත ස්ථාන මාරු පරිපාටියට අනුකූලව ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන ස්ථාන මාරු මණ්ඩලයක් විසින් වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් පත් සහ අදාළ අනෙකුත් විස්තර සලකා බලා ඉදිරිපත් කරනු ලබන නිර්දේශ සැලකිල්ලට ගෙන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් ස්ථාන මාරු නියෝග නිකුත් කරනු ලැබේ.

3. වාර්ෂික ස්ථාන මාරු වීම් වලින් පරිබාහිරව අනුමත කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව නොඉක්මවන පරිදි පහත හේතූන් මත ස්ථාන මාරුවීමක් කළ හැකිය.

(අ) සේවා අවශ්‍යතාවය මත
(ආ) පත් කළ රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ මත
(ඇ) සේවා ස්ථානයේ වෙනසක් නොවන මාරු කිරිම්
(ඈ) විනය හේතු
(ඉ) අන්‍යෝන්‍ය ස්ථාන මාරු

4. <u>වාර්ෂික ස්ථාන මාරුවීම්</u>

04.1 ස්ථාන මාරු අපේක්ෂා කරන නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටු කිරිම සඳහා වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය ක්‍රියාත්මක කෙරේ.

04.2 06.01 ඡේදයේ සඳහන් පරිදි එක් සේවා ස්ථානයක නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට තමන් කැමති පශු වෛද්‍ය නිලධාරී තනතුරු අනුමතව ඇති වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ලබා ගැනිමට ඉල්ලුම් කළ හැකිය.

04.3 එවැනි ස්ථාන මාරු ඉල්ලීම් ආකෘති පත්‍ර 1 හි පරිදි ඉදිරිපත් කළ යුතුවේ.

04.4 ස්ථාන මාරුවීම්වලදී සළකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති පහත පරිදි වේ.

4.4.1 වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී සුදුසුකම් ලබන සේවා කාලය ගණනය කරනු ලබන්නේ පවත්නා වසරේ **දෙසැම්බර් 31** දිනටය.

4.4.2 ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ උපලේඛන ගත තනතුරු හැර අනෙකුත් තනතුරු දරණ නිලධාරීන් මෙම ස්ථාන මාරුවීම්වලට යටත්ය.

4.4.3 යම් නිලධාරියෙකු කිසියම් සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සේවයේ නිරතවී සිටිනම්, වෙනත් ඉල්ලීම් කිරීමට සුදුසු කම් ලබා ඇති නිලධාරියෙකුට ස්ථාන මාරු ලබා දීමට හැකි වන පරිදි ඔහුගේ කැමැත්ත නොමැතිව වුවද ස්ථාන මාරුවක් ලැබීමට යටත් වනු ඇත.

4.4.4 වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කිරිම නිලධාරීන්ගේ වගකීම වන අතර, එසේ ස්ථාන මාරු අයඳුම් නොකරන, නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු ඇති වන සේවා ස්ථානයකට ස්ථාන මාරු කරනු ලැබේ.

වසර 05 සම්පූර්ණ කරනු ලබන නිලධාරින්ගේ පහසුව සඳහා ඉදිරියේදී වසර 05 සම්පූර්ණ කරන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරින්ගේ ලේඛණයක් ප්‍රසිද්ධ කරනු ඇත.

4.4.5 දුෂ්කර, ප්‍රිය මනාප නොවන සේවා ස්ථාන වන බස්නාහිර පළාත තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් B,C,D වශයෙන් වර්ගීකරණය කර ඇති පශු වෛද්‍ය කාර්යාල සහ පශු රෝහල, පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, දිස්ත්‍රික් පශු වෛද්‍ය කාර්යාලවල හා බස්නාහිර පළාත් සභාවේ මහා නගර සභාවල සේවය කරන (උපලේඛණ ගත තනතුරු නොදරණ) නිළධාරීන්ට තම සේවා කාලය සම්පූර්ණ කර ඇති විට ස්ථාන මාරු ලබා දීමට හැකිවන සේ මෙම සේවා ස්ථානයන්ට වෙනත් නිලධාරීන් ඉල්ලීම් නොකරන්නේ නම්, සේවා කාලය තුළ ප්‍රියමනාප නොවන සේවා ස්ථානවල සේවය නොකරන ලද නිලධාරීන් අතුරින් 6.02 අනුව අඩුම ලකුණු ලබාගන්නා නිලධාරින් සිය මනාපය පළ කර නොමැතිව වුවද ස්ථාන මාරු මණ්ඩලයට ස්ථාන මාරු නිර්දේශ කිරීමේ හැකියාව ඇත.

4.4.6 වයස අවුරුදු 57 සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු දිස්ත්‍රික්කය තුළ ස්ථාන මාරු කිරීමට යටත් වේ. අවුරුදු 59 සම්පූර්ණ නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් නොවන අතර, එකී නිළධාරියාගේ කැමැත්තක් නොමැතිව මෙම පරිපාටියට අනුව ස්ථාන මාරුවීම් වලට භාජනය නොවනු ඇත.

4.4.7 ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය, ස්ථාන මාරුව ක්‍රියාත්මක වන වසරේ ජනවාරි 01 වේ.

## 5. සේවා ස්ථාන වර්ගීකරණය

ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා නිලධාරීන් සේවයේ යෙදී ඇති එක් එක් පළාත්, දිස්ත්‍රික්කය හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස පහත පරිදි වර්ග කරනු ලැබේ. (උපලේඛණය 1 )

A වර්ගය - ප්‍රියමනාප

B වර්ගය - ප්‍රියමනාප නොවන

C වර්ගය - දුෂ්කර

D වර්ගය - අතිදුෂ්කර

## 6. ස්ථාන මාරුවක් ඉල්ලීමේ දි සැලකිල්ලට ගත යුතු කරුණු

06.1 ස්ථාන මාරු ඉල්ලිම සඳහා සපුරාලිය යුතු අවම සේවා කාලය

- අති දුෂ්කර සේවා ස්ථානයක ( D )වසර දෙකක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවක් අයදුම් කළ හැකිවේ.
- දුෂ්කර සේවා ස්ථානයක ( C ) වසර තුනක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවක් අයදුම් කළ හැකිවේ.
- ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක ( B ) වසර තුනක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවක් අයදුම් කළ හැකිවේ.

- ප්‍රියමනාප සේවා ස්ථානයක( A ) වසර පහක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකුට ස්ථාන මාරුවක් අයදුම් කළ හැකිවේ.
- ඕනෑම සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු ස්ථාන මාරුවකට අනිවාර්යයයෙන් යටත් විය යුතුය.

06.2 <u>ස්ථාන මාරු ලබා ගැනිම සඳහා ලකුණු දිමේ ක්‍රමය</u>

06.2.1 සේවය කරන ලද පළාත / දිස්ත්‍රික්කය / ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය අනුව නිලධාරියෙකුට ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය 70 කි.

06.2.2 ඉහත 06 ඡේදයේ දැක්වෙන සේවා ස්ථාන වර්ගීකරණය අනුව ඒ ඒ සේවා ස්ථානවල සේවය කර ඇති කාල සීමාව සැලකිල්ලට ගෙන නිලධාරින්ට පහත දැක්වෙන පරිදි ලකුණු ලබා දෙනු ඇත.

| | | ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අනුව | දිස්ත්‍රික්කය අනුව | පළාත අනුව |
|---|---|---|---|---|
| 1 | ප්‍රියමනාප | පූර්ණ වර්ෂයකට ලකුණු 1 | පූර්ණ වර්ෂයකට ලකුණු 1 | පූර්ණ වර්ෂයකට ලකුණු 1 |
| 2 | ප්‍රියමනාප නොවන | පූර්ණ වර්ෂයකට ලකුණු 2 | පූර්ණ වර්ෂයකට ලකුණු 2 | පූර්ණ වර්ෂයකට ලකුණු 2 |
| 3 | දුෂ්කර | පූර්ණ වර්ෂයකට ලකුණු 3 | පූර්ණ වර්ෂයකට ලකුණු 3 | පූර්ණ වර්ෂයකට ලකුණු 3 |
| 4 | අතිදුෂ්කර | පූර්ණ වර්ෂයකට ලකුණු 4 | පූර්ණ වර්ෂයකට ලකුණු 4 | පූර්ණ වර්ෂයකට ලකුණු 4 |

වසරකට අඩු එහෙත් මාස 06 ක් හෝ ඊට වඩා වැඩි කාලයක් යම් සේවා ස්ථානයක සේවය කර ඇත්නම් ඔහුට / ඇයට අදාළ සේවා ස්ථානය අයත් පළාත /දිස්ත්‍රික්කය/ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය අනුව එම සේවා ස්ථානයට හිමි ලකුණු ප්‍රමාණයෙන් 50%ක් හිමිවේ.

6.2.3 නිළධාරියා සේවය කළ කාලය සලකා ඉහත පරිදි ලකුණු ලබා දීමට අමතරව ස්ථාන මාරු ලබා දිමේදී ස්ථාන මාරු මණ්ඩලය පහත කරුණු ද ඇගයීමට ලක්කර ලකුණු ලබා දීමක් සිදු කෙරේ. (ඇමුණුම - 01)

1. ස්ථිර පදිංචිය — ලකුණු 05
2. කලත්‍රයාගේ රැකියා ස්ථානය/අභාවය — ලකුණු 05
3. පාසල් යන දරුවන් සිටීම / දෙමාපියන්ට රැකවරණය සැලසීම — ලකුණු 05
4. මාරු මණ්ඩලයේ අභිමතය පරිදි සැලකිල්ලට ගත් විශේෂ කරුණු — ලකුණු 05

5.නිලධාරියාගේ කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනිම ලකුණු 05

6. අදාළ කාලය තුළ ඉතිරි කරගත් නිවාඩු ලකුණු 05

එකතුව ලකුණු 30

7. ප්‍රිය මනාප සේවා ස්ථාන වල වසර 05ක හෝ ඊට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිළධාරීන් ඔවුන්ගේ මනාපය නොමැති වුවද ,නිළධාරින් සේවය කිරිමට මනාපය පල නොකරන සේවා ස්ථාන වන බස්නාහිර පළාත තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් B,C,D වශයෙන් වර්ගීකරණ කර ඇති පශු වෛද්‍ය කාර්යාල, පශු රෝහල, පළාත් අධ්‍යක්ෂ කාර්යාලය, දිස්ත්‍රික් පශු වෛද්‍ය කාර්යාලයන්හි (උපලේඛණ ගත තනතුරු නොවන) පුරප්පාඩු පිරවීමට හැකිවනසේ ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි ස්ථානමාරු කිරිම්-සිදු කරනු ඇත.

8. <u>වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරිම</u>

8.1 වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය පහත සදහන් නිලධාරීන්ගෙන් සමන්විත වේ.

01. ප්‍රධාන ලේකම් හෝ ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන මාණ්ඩලික නිලධාරියෙකු

02. පළාත් සෞඛ්‍ය හා සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශයෙන් හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් එක් නියෝජිතයෙකු බැගින් නියෝජිතයින් දෙදෙනෙකු

03. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ සහ පළාත් පාලන කොමසාරිස්

04. ලියාපදිංචි කරන ලද පශු වෛද්‍ය නිළධාරීන්ගේ වෘත්තීය සංගම්වල එක් නියෝජිතයෙකු (පශු වෛද්‍ය නිළධාරින්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් පමණි)

8.2 එම දැන්වීමෙහි සදහන් යෝජිත වාර්ෂික ස්ථානමාරු වලින් අතෘප්තියට පත් වන නිළධාරීන් විසින් සිය අභියාචනා ආකෘති පත්‍ර අංක II අනුව වාර්ෂික ස්ථානමාරු සමාලෝචන කමිටුවට අභියාචනයක් ඉදිරිපත් කළ යුතුය.

වාර්ෂික ස්ථාන මාරුවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ ආකෘති අංක I මගින් ස්ථාන මාරු ඉල්ලීම් ඉදිරිපත් කළ නිළධාරින් පමණි.

මෙම අභියාචනා ආයතන ප්‍රධානියා / අමාත්‍යාංශ ලේකම් නිර්දේශ සහිතව සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුය.

8.3 වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය ප්‍රධාන ලේකම් හෝ ප්‍රධාන ලේකම් විසින් පත් කරනු ලබන නිලධාරියෙකු, පළාත් අමාත්‍යාංශයෙන් එක් නියෝජිතයෙකු බැගින් නියෝජිතයින් දෙදෙනෙකු සහ දෙපාර්තුමේන්තු ප්‍රධානීන්

8.4 සෑම වසරකම ඔක්තෝබර් මස 15 දිනට ප්‍රථම මෙම සමාලෝචන කමිටුව විසින් ඉදිරිපත්ව ඇති අභියාචනා සලකා බලා සිය නිර්දේශය ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එම නිර්දේශ සඳහා පදනම් වූ හේතුද එම වාර්තාවෙහි අඩංගු විය යුතුය.

8.5 වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ යෝජනා සහ වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුවේ නිර්දේශද සැලකිල්ලට ගෙන ප්‍රධාන ලේකම් විසින් වාර්ෂික ස්ථාන මාරු නියෝග නොවැම්බර් 01 දිනට පෙර නිකුත් කළ යුතුය.

8.6 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලබන සියළුම නිළධාරීන් නියමිත දිනට එම නියෝගයේ පරිදි නියමිත සේවා ස්ථාන වෙත රාජකාරියට වාර්තා කළ යුතුය.

9. <u>වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු</u>

9.1 ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම සඳහා සලකා බැලීම සඳහා බස්නාහිර පළාත් කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ 195 වන වගන්තිය අනුව එක් එක් සේවාවන් සඳහා වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු පිහිටුවා ඒ අනුව අවශ්‍ය කටයුතු කරනු ඇත. සියළුම කරුණු දැක්වීම් 13 පරිශිෂ්ඨය ප්‍රකාරව ආකෘති II ආයතන ප්‍රධානීන්/ දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ අමාත්‍යාංශ ලේකම්වරුන් මඟින් මා වෙත යොමු කල යුතුය. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන කරුණු දැක්වීම් සලකා බලනු ලබන්නේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ ඉහත විධිවිධානයන්ට අනුකූල නම් පමණි.

9.2 නිලධාරියෙකුගේ ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව කරුණු දැක්වීමට එම නිලධාරියාට හෝ ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට හෝ හිමිකමක් නොමැත.

9.3 ස්ථාන මාරු නියෝගයන්ට විරුද්ධව කෙරෙන කරුණු දැක්වීම් සලකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටුව විසින් පහත සඳහන් කරුණු පිළිබඳව පරීක්ෂා කර බලා තීරණ ගනු ඇත.

- මාරුවීම් ප්‍රතිපත්තියට අනුකූල නොවන පරිදි සිදු කරන ලද මාරුවීම්
- නිලධාරීන්ගේ ඉල්ලීම් ඉටු නොවූ අවස්ථා
- නිලධාරීන්ගේ ඉල්ලීම් වලට පටහැනි ලෙස සිදු කළ මාරුවීම් ස්ථාන මාරු අයදුම් කරන ලද දිනයෙන් පසු නිළධාරින්ට සිදු වන හදිසි විපත්, කරදර, අසනීප වැනි සානුකම්පිත තත්වයන් පිළිබඳ පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කර ඇත්නම් එම කරුණු

9.4 වෛද්‍ය හේතූන් මත ස්ථාන මාරු අවලංගු කරවා ගැනීමට හෝ ස්ථාන මාරු කරනු ලැබූ සේවා ස්ථානය මාරු කර ගැනීමට කරුණු දැක්වීම් ඉදිරිපත් කරන්නේ නම්, තම රෝගී තත්වය රජයේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියකුගේ වෛද්‍ය සහතිකයක් මගින් සනාථ කළ යුතුය. එසේම ස්ථාන මාරු අයදුම් කරන අවස්ථාවේ අසනීප තත්ත්වයක් පැවතියේ නම් ඒ බව වෛද්‍ය සහතිකයේ පිටපතක්ද සමඟ අයදුම් පත්‍රයේ සටහන් කර තිබිය යුතුය.

9.5 ස්ථාන මාරුවීම් ඉල්ලුම් නොකරන ලද මුත් සේවා කාලය පදනම් කරගෙන සිදු කරනු ලබන ස්ථානමාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරන කරුණු දැක්වීම් සලකා බලනු ලබන්නේ ස්ථාන මාරුවීම් ඉල්ලුම් කරන ලද නිලධාරීන්ගේ කරුණු දැක්වීම් කෙරෙහි දැඩි සැලකිල්ලක් දැක්වීමෙන් අනතුරුවය.

9.6 වත්මන් සේවා ස්ථානයට ආසන්න ස්ථාන වලට හෝ සැලකිය යුතු තරම් දුරක නොවන ස්ථානවලට මාරුවීම් ලැබූ නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු දැක්වීම් කුමන පදනමක් මත හෝ සලකා බලනු නොලැබේ.

10. <u>වාර්ෂික ස්ථාන මාරු අභියාචනා</u>

වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ නිකුත් කළ **පසු** ඉදිරිපත් කරනු ලබන අභියාචනා, සමාලෝචන කමිටු තීරණය නිකුත් කළ දින සිට දින 14 ඇතුළත බස්නාහිර පළාත් කාර්ය පරිපාටික රීතින්හි XX වැනි පරිච්ඡේදයේ 216 (ආ) හා 217 වගන්තිය අනුව 22 පරිශිෂ්ටය ප්‍රකාරව පමණක් අයදුම්පත් සෘජුවම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

10.1 තමන් විසින් ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාල ලියවිලි වල සහතික පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමට ද ක්‍රියා කළ යුතුය. නියමිත කාලය තුළදී ඉදිරිපත් නොවන අභියාචනා හා සමාලෝචන කමිටුව වෙත ඉදිරිපත් නොකළ කිසිදු නව අභියාචනාවක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අභියාචනා කමිටුව විසින් සලකා නොලබනු ඇත.

11. යම් නිළධාරියෙකු මීට පෙර තමා සේවය කළ ස්ථානයක් නැවත ඉල්ලා සිටි විට එම සේවා ස්ථානය එම නිළධාරියාට ලබා දීම පිළිබද සලකා බලනුයේ එම සේවා ස්ථානය සඳහා වෙනත් නිළධාරියෙකු ඉල්ලිමක් ඉදිරිපත් කර නොමැති අවස්ථාවක පමණි.

12. **ස්ථාන මාරු කාලසටහන**

| | | |
|---|---|---|
| **2022 අගෝස්තු 15 ට පෙර** | - | වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති හා පරිපාටි සකස්කිරීම. |
| **2022 අගෝස්තු 25 ට පෙර** | - | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර කැඳවීම් නිවේදනය නිකුත් කිරීම. |
| **2022 සැප්තැම්බර් 25 ට පෙර** | - | ස්ථාන මාරු අයදුම්පත් භාරගන්නා අවසාන දිනය |
| **2022 ඔක්තෝම්බර් 25 ට පෙර** | - | මාරු කමිටු එක් රැස්වී ස්ථාන මාරු තීරණ ගැනීම අවසන් කිරීම. |
| **2022 නොවැම්බර් 10 ට පෙර** | - | ස්ථාන මාරු නියෝග නිකුත්කිරීම |
| **2022 නොවැම්බර් 25 ට පෙර** | - | අභියාචනා ඉදිරිපත් කළ යුතු අවසන් දිනය |
| **2022 දෙසැම්බර් 10 ට පෙර** | - | වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු පිහිටුවීම හා තීරණ ගැනීම |
| **2022 දෙසැම්බර් 25 ට පෙර** | - | සමාලෝචන කමිටු තීරණ දැනුම් දී අවසන් කිරීම |

## ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය (පශු වෛද්‍ය නිලධාරී)
## බස්නාහිර පළාතේ නිළධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම් පත්‍රය

1.නිලධාරියාගේ සම්පූර්ණ නම : ........................................................................................................
........................................................................................................................................

2.ජාතික හැඳුනුම්පත් අංකය : ......................................................................................

3.ස්ථිර පෞද්ගලික ලිපිනය : ..........................................................................................
..........................................................................................................................................

4. දුරකථන අංකය : ................................
5. උපන් දිනය: : අවු...........මාසය.........දිනය...........
6. ස්ත්‍රී පුරුෂභාවය
7.නිළධාරියාගේ විවාහක /අවිවාහක බව: ......................

I. දරුවන් පිළිබඳ තොරතුරු

| දරුවන්ගේ නම | වයස | පාසල් යන්නේ නම් පාසල |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

II. කලත්‍රයාගේ නම:..........................................................................................................

III කලත්‍රයාගේ රැකියාව :-

තනතුර :.........................................................................................................

සේවා ස්ථානයේ ලිපිනය:.......................................................................................

8. ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය සේවයේ දැනට දරණ තනතුර:...................................................

I. දැනට සිටින ශ්‍රේණිය .............................
II. මුල් පත්වීමේ දිනය: .............................
III. බස්නාහිර පළාතට පැමිණි දිනය .............................

IV. සේවයට ඇතුලත් වූ දින සිට මේ දක්වා එක් එක් සේවා ස්ථානයන්හි තොරතුරු සහ ලබා 6.2 අනුව ගත් ලකුණු ප්‍රමාණයන් ( මෙම තොරතුරු නව සේවා ස්ථාන ලබා දීමේ දී ඉතා වැදගත් බැවින් ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් වෙනත් ඇමුණුමක සඳහන් කරන්න)

| සේවා ස්ථාන | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වර්ගීකරණය අනුව සේවා ස්ථානයේ වර්ගය(A,B,C,D) | | | සිට- දක්වා | මුළු කාලය | සේවය කරන ලද සේවා ස්ථාන අනුව තමන් විසින් අපේක්ෂා කරන ලකුණු |
|---|---|---|---|---|---|---|---|
| | | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | | | |
| | | | | | | | |

09.ස්ථාන මාරුව ඉල්ලා සිටින සේවා ස්ථාන 03ක් මනාපය අනුව

1................................ 2 .................................... 3................................

(ඔබගේ පළමු මනාපය ලබා දෙන්නේද යන්න තීරණය කරනුයේ ඔබ ඉල්ලා ඇති සේවා ස්ථානයට වෙනත් නිළධාරීන්ගේ ඉල්ලීම් අනුවය.යම් සේවා ස්ථානයකට නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අයදුම් කර ඇති විට මීට පෙර එම සේවා ස්ථානයේ සේවය කර නොමැති 6.02 අනුව වැඩිම ලකුණු ලබා ගත් නිළධාරියාට එම සේවා ස්ථානය ලබා දෙනු ඇත.)

මා විසින් ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.......................................

නිළධාරියාගේ අත්සන
නිල මුද්‍රාව තබන්න

ආකෘති අංක II

නම .............................................
තනතුර ........................................
ලිපිනය ........................................
දිනය ...........................................

............................................
............................................

<u>**යෝජිත ස්ථාන මාරුව සම්බන්ධයෙන් කරුණු දැක්වීම**</u>

ඔබගේ අංක .................................................... හා ................................ දිනැති ලිපිය/යෝජිත වාර්ෂික ස්ථාන මාරු ලේඛණය මගින් මා ..........................................................................................ට ස්ථාන මාරු කිරීමට යෝජිත බව දන්වා ඇත.

02. පහතින් විස්තර කරනු ලබන කරුණු මත එම යෝජිත ස්ථාන මාරුව අවලංගු කරන ලෙස, සංශෝධනය කරන ලෙස, නැවත සලකා බලන ලෙස බස්නාහිර පළාත් සහා රාජ්‍ය සේවා කාර්යය පරිපාටික රීති සංග්‍රහයේ I වන කාණ්ඩයෙහි 195 වන වගන්තිය ප්‍රකාරව ඔබගෙන් කරුණිකව ඉල්ලා සිටිමි.

2.1.................................................................................................................................................
.....................................................................................................................................
2.2.................................................................................................................................................
.....................................................................................................................................
2.3.................................................................................................................................................
.....................................................................................................................................

03 ඉහත සදහන් කරුණු සනාථ කිරීම සදහා අදාළ පහත සදහන් ලියවිලි වල සහතික කළ ඡායා පිටපත් මේ සමග යා කර ඇත.

04 මාගේ වාර්ෂික ස්ථාන මාරුව පහත සදහන් සේවා ස්ථානයකට ලබා දෙන ලෙසද ඉල්ලමි.
පළමුවන මනාපය .......................................................
දෙවන මනාපය .......................................................
තෙවන මනාපය .....................................................

...................................
අත්සන

පිටපත්:
1.පත්කිරීම් බලධරයා
2.දෙපාර්තමේන්තු ප්‍රධානියා
3.ආයතන ප්‍රධානියා

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය**
(පත්කිරීම් බලධාරයා)
......................................................
...................................................... විසින් ඉහතින් දක්වා ඇති කරුණු සත්‍ය බවට සෑහීමකට පත්වෙමි/නොවෙමි.
ඉල්ලීම ඉටු කිරීම නිර්දේශ කරමි/නොකරමි.

අත්සන....................................................
නම....................................................
තනතුර....................................................
නිල මුද්‍රාව....................................................

# සේවා ස්ථාන වර්ගීකරණය

| පළාත | පළාත් වර්ගීකරණ | දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් වර්ගීකරණය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය වර්ගීකරණය |
|---|---|---|---|---|---|
| බස්නාහිර | A | කොළඹ | A | කොළඹ | A |
| | | | | දෙහිවල-ගල්කිස්ස | A |
| | | | | හෝමාගම | A |
| | | | | හංවැල්ල | A |
| | | | | කැස්බෑව | A |
| | | | | පිළියන්දල | B |
| | | | | කොලොන්නාව | A |
| | | | | කඩුවෙල | A |
| | | | | මොරටුව | A |
| | | | | මහරගම | A |
| | | | | පාදුක්ක | A |
| | | | | ශ්‍රී ජයවර්ධනපුර | A |
| | | | | තිඹිරිගස්යාය | A |
| | | ගම්පහ | A | අත්තනගල්ල | A |
| | | | | බියගම | A |
| | | | | දොම්පේ | A |
| | | | | දිවුලපිටිය | A |
| | | | | ගම්පහ | A |
| | | | | ජාඇල | A |
| | | | | කැළණිය | A |
| | | | | කටාන | A |
| | | | | මීනුවන්ගොඩ | A |
| | | | | මීරිගම | A |
| | | | | මහර | A |
| | | | | මීගමුව | A |
| | | | | වත්තල | A |
| | | කළුතර | A | අගලවත්ත | B |
| | | | | බේරුවල | B |
| | | | | බුලත්සිංහල | **C** |
| | | | | බණ්ඩාරගම | B |
| | | | | දොඩංගොඩ | B |
| | | | | හොරණ | A |
| | | | | ඉංගිරිය | **C** |
| | | | | කළුතර | A |
| | | | | මතුගම | A |
| | | | | මිල්ලනිය | **C** |
| | | | | මදුරාවල | **C** |
| | | | | පානදුර | A |
| | | | | පාලින්දනුවර | **C** |
| | | | | වලල්ලාවිට | **C** |

| | | | | | |
|---|---|---|---|---|---|
| මධ්‍යම | A | මහනුවර | A | අකුරණ | A |
| | | | | දොළුව | B |
| | | | | දෙල්තොට | B |
| | | | | ගඟ ඉහළ කෝරලය | B |
| | | | | හතරලියැද්ද | B |
| | | | | හාරිස්පත්තුව | A |
| | | | | කුණ්ඩසාලේ | A |
| | | | | ගඟවට කෝරලය | A |
| | | | | මිණිපේ | **C** |
| | | | | මැදදුම්බර/තෙල්දෙනිය | B |
| | | | | පස්බාගේ කෝරලේ | B |
| | | | | පාතදුම්බර | A |
| | | | | පාතහේවාහැට | A |
| | | | | පූජාපිටිය | B |
| | | | | පන්විල | **C** |
| | | | | තුම්පනේ | B |
| | | | | උඩපළාත | A |
| | | | | උඩුනුවර | A |
| | | | | උඩුදුම්බර | **C** |
| | | | | යටිනුවර | A |
| | | මාතලේ | A | අඹන්ගඟ කෝරලේ | B |
| | | | | දඹුල්ල | B |
| | | | | ගලේවෙල | B |
| | | | | ලග්ගල-පල්ලේගම | **C** |
| | | | | මාතලේ | A |
| | | | | නාඋල | B |
| | | | | පල්ලෙපොල | B |
| | | | | රත්තොට | B |
| | | | | උකුවෙල | B |
| | | | | විල්ගමුව | D |
| | | | | යටවත්ත | B |
| | | නුවරඑළිය | **C** | අඹගමුව | A |
| | | | | හගුරන්කෙත | B |
| | | | | කොත්මලේ | **C** |
| | | | | නුවරඑළිය | A |
| | | | | වලපනේ | **C** |
| **දකුණ** | B | ගාල්ල | B | අම්බලන්ගොඩ | A |
| | | | | අක්මීමන | A |
| | | | | බලපිටය | B |
| | | | | බෙන්තොට | A |
| | | | | බෝපේ-පෝද්දල | B |
| | | | | බද්දේගම | A |
| | | | | ඇල්පිටිය | A |
| | | | | ගාල්ල කඩවත්සකර | A |
| | | | | හික්කඩුව | A |

| | | | | | |
|---|---|---|---|---|---|
| දකුණ | B | ගාල්ල | A | හබරාදූව | A |
| | | | | ඉමදූව | B |
| | | | | කරන්දෙණිය | A |
| | | | | නෙළුව | **C** |
| | | | | නියාගම | B |
| | | | | නාගොඩ | **C** |
| | | | | තවලම | **C** |
| | | | | වැලිපිටිය-දිවිතුර | B |
| | | | | යක්කලමුල්ල | B |
| | | හම්බන්තොට | **C** | අගුණකොලපැලැස්ස | **C** |
| | | | | අම්බලන්ගොඩ | **C** |
| | | | | බෙලිඅත්ත | **C** |
| | | | | හම්බන්තොට | **C** |
| | | | | කටුවන | **C** |
| | | | | ලුණුගම්වෙහෙර | **C** |
| | | | | ඕකේවෙල | **C** |
| | | | | සූරියවැව | **C** |
| | | | | තිස්සමහාරාමය | **C** |
| | | | | තංගල්ල | B |
| | | | | වීරකැටිය | **C** |
| | | මාතර | A | අතුරලිය | **C** |
| | | | | අකුරැස්ස | B |
| | | | | දික්වැල්ල | B |
| | | | | දෙවිනුවර | B |
| | | | | හක්මන | B |
| | | | | කිරින්ද පුහුල්වැල්ල | **C** |
| | | | | කොටපොල | **C** |
| | | | | කඹුරුපිටිය | B |
| | | | | මාතර කඩවත්සතර | A |
| | | | | මුලටියන | **C** |
| | | | | මාලිම්බඩ | **C** |
| | | | | පිටබැද්දර | **C** |
| | | | | පස්ගොඩ | **C** |
| | | | | තිහගොඩ | **C** |
| | | | | වැලිපිටිය | **C** |
| | | | | වැලිගම | A |
| උතුර | D | යාපනය | B | ඩෙල්ෆ්ට් | D |
| | | | | කයිට්ස් | D |
| | | | | වෙලනායි | **C** |
| | | | | යාපනය | A |
| | | | | නල්ලූර් | B |
| | | | | චාවකච්චේරි | A |
| | | | | වඩමාරච්චි-නැගෙනහිර | D |
| | | | | පේදුරුතුඩුව | A |
| | | | | කෝපායි | B |
| | | | | විලක්කාමම්-උතුර | **C** |

| | | | | | |
|---|---|---|---|---|---|
| උතුර | D | යාපනය | B | උඩුවිල් | A |
| | | | | සන්දිලිපායි | B |
| | | | | විලක්කාමම්- බටහිර | **C** |
| | | | | වඩමාරච්චි දකුණු -බටහිර | D |
| | | කිලිනොච්චි | D | කරච්චි | D |
| | | | | කන්දවලායි | D |
| | | | | පූනක්කරේ | D |
| | | | | පච්චිලයි පල්ලි | D |
| | | මන්නාරම | D | මන්නාරම් නගරය | D |
| | | | | මන්තායි බටහිර | D |
| | | | | මුසලායි | D |
| | | | | මධු | D |
| | | | | නානාටන් | D |
| | | මුලතිව් | D | මැරිටයිම් පත්තු | D |
| | | | | මන්තායි නැගෙනහිර | D |
| | | | | ඔඩ්ඩුසුඩාන් | D |
| | | | | පුතුකුඩිරප්පු | D |
| | | | | තුනල්වරිනි | D |
| | | වවුනියාව | **C** | වවුනියාව උතුර | D |
| | | | | වවුනියාව දකුණ | B |
| | | | | වෙන්ගල වෙඩ්ඩිකුලම් | **C** |
| | | | | වවුනියාව | A |
| නැගෙන | | අම්පාර | **C** | අක්කරෙයිපත්තු | A |
| | | | | අලයාඩිවෙම්බු | B |
| | | | | අම්පාර | A |
| | | | | අමාලච්චෙනෙයි | B |
| | | | | දෙහිඅත්තකණ්ඩිය | B |
| | | | | දමන | C |
| | | | | එරගම | C |
| | | | | කරෙයිතිවු | A |
| | | | | කල්මුනේ | A |
| | | | | ලාහුගල | D |
| | | | | මහඔය | C |
| | | | | නින්දාවූර් | A |
| | | | | නාවිදන්වෙලි | A |
| | | | | පොතුවිල් | **B** |
| | | | | පදියතලාව | D |
| | | | | සමන්තුරේ | A |
| | | | | සායින්දමාදු | B |
| | | | | තිරුක්කෝවිල් | A |
| | | | | උහග | **B** |
| | | මඩකලපුව | **C** | එරාවූර් නගරය | B |
| | | | | එරාවූර් පත්තු | A |
| | | | | වාලච්චෙනෙයි | B |
| | | | | කෝරලේ පත්තු -උතුර | A |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | කෝරලේ පත්තු බටහිර | B |
| | | | | කාතාන්කුඩි | A |
| | | | | මන්මුනේ පත්තු | A |
| | | | | මන්මුනේ දකුණ සහ එරුවිල් පත්ත්තු | C |
| | | | | මන්මුනේ දකුණ බටහිර | C |
| | | | | මන්මුනේ බටහිර | C |
| | | | | මන්මුනේ උතුර | A |
| | | | | පොරාතිවු පත්තු (1) | C |
| | | ත්‍රිකුණාමලය | B | ගෝමරන්කඩවල | D |
| | | | | කින්නියා | A |
| | | | | කුච්චවේලි | B |
| | | | | කන්තලේ | A |
| | | | | මුත්තූර් | B |
| | | | | මොරවැව | B |
| | | | | පදවි ශ්‍රී පුර | C |
| | | | | සේරුවිල | C |
| | | | | ත්‍රිකුණාමලය නගරය | A |
| | | | | තඹලගමුව | A |
| | | | | ඊච්චිලම් පත්තු | D |
| වයඹ | B | කුරුණෑගල | A | අඹන්පොල | B |
| | | | | අලව්ව | A |
| | | | | බිංගිරිය | B |
| | | | | බමුණාකොටුව | C |
| | | | | ඇහැටුවැව | C |
| | | | | ගණේවත්ත | B |
| | | | | ගිරිබාව | D |
| | | | | ගල්ගමුව | C |
| | | | | ඉබ්බාගමුව | A |
| | | | | කොබෙයිගනේ | B |
| | | | | කොටවෙහෙර | C |
| | | | | කුලියාපිටිය නැගෙනහිර | A |
| | | | | කුලියාපිටිය බටහිර | A |
| | | | | කුරුණෑගල | A |
| | | | | කොටුපොත | B |
| | | | | මල්ලවපිටිය | C |
| | | | | මාස්පොත | C |
| | | | | මාවතගම | A |
| | | | | මාගෝ | B |
| | | | | නිකවැරටිය | B |
| | | | | නාරම්මල | A |
| | | | | පන්නල | A |
| | | | | පොල්ගහවෙල | A |
| | | | | පොල්පිටිගම | D |
| | | | | පඩුවස්නුවර | B |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | රිදිගම | B |
| | | | | රස්නායකපුර | D |
| | | | | උඩුබද්දාව | B |
| | | | | වීරම්බුගෙදර | C |
| | | | | වාරියපොල | A |
| | | පුත්තලම | B | ආරච්චිකට්ටුව | A |
| | | | | ආනමඩුව | C |
| | | | | හලාවත | A |
| | | | | දංකොටුව | A |
| | | | | කරුවලගස්වැව | D |
| | | | | කල්පිටිය | D |
| | | | | මහකුඹුක්කඩවල | D |
| | | | | මහවැව | B |
| | | | | මුදලේ | B |
| | | | | මාදම්පේ | B |
| | | | | නවගත්තේගම | D |
| | | | | නාත්තණ්ඩිය | A |
| | | | | පුත්තලම | B |
| | | | | පල්ලගම | C |
| | | | | වනාතවිල්ලුව | D |
| | | | | වෙන්නප්පුව | A |
| උතුරුමැද | C | අනුරාධපුර | B | ගල්නෑව | B |
| | | | | ගෙලෙන්බිඳුනුවැව | B |
| | | | | හොරොව්පතාන | D |
| | | | | ඉපලෝගම | B |
| | | | | කැබිතිගොල්ලෑව | D |
| | | | | කැකිරාව | A |
| | | | | කහටගස්දිගිලිය | B |
| | | | | මැදවච්චිය | B |
| | | | | මිහින්තලේ | B |
| | | | | මහවිලච්චිය | D |
| | | | | නැගෙනහිර නුවරගම් | A |
| | | | | නාච්චදූව | B |
| | | | | නොච්චියාගම | B |
| | | | | මධ්‍යම නුවරගම් පළාත | A |
| | | | | පලාගල | C |
| | | | | පලුගස්වැව | C |
| | | | | පදවිය | C |
| | | | | රඹෑව | C |
| | | | | රාජාංගනය | B |
| | | | | තඹුත්තේගම | A |
| | | | | තිරප්පනේ | B |
| | | | | තලාව | B |
| | | පොලොන්න | B | දිඹුලාගල | C |
| | | | | ඇලහැර | B |
| | | | | හිගුරක්ගොඩ | A |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ලංකාපුර | B |
| | | | | මැදිරිගිරිය | B |
| | | | | තමන්කඩුව | A |
| | | | | වැලිකන්ද | D |
| සබරගමුව | B | කෑගල්ල | A | අරනායක | C |
| | | | | බුලත්කොහුපිටිය | C |
| | | | | දැරණියගල | D |
| | | | | දෙහිඕවිට | B |
| | | | | ගලිගමුව | B |
| | | | | කෑගල්ල | A |
| | | | | මාවනැල්ල | A |
| | | | | රුවන්වැල්ල | B |
| | | | | රඹුක්කන | B |
| | | | | වරකාපොල | A |
| | | | | යටියන්තොට | C |
| | | රත්නපුර | B | අයගම | D |
| | | | | බලංගොඩ | D |
| | | | | ඇලපොත | C |
| | | | | ඇඹිලිපිටිය | B |
| | | | | ඇහැලියගොඩ | A |
| | | | | ගොඩකවෙල | B |
| | | | | ඉඹුල්පෙ | B |
| | | | | කලවාන | C |
| | | | | කිරිඇල්ල | B |
| | | | | කොලොන්න | C |
| | | | | කුරුවිට | B |
| | | | | කහවත්ත | C |
| | | | | නිවිතිගල | C |
| | | | | ඕපනායක | C |
| | | | | පැල්මඩුල්ල | B |
| | | | | රත්නපුර | A |
| | | | | වැලිගෙපොල | D |
| ඌව | C | බදුල්ල | B | බණ්ඩාරවෙල | A |
| | | | | බදුල්ල | A |
| | | | | ඇල්ල | C |
| | | | | හපුතලේ | B |
| | | | | හල්දුම්මුල්ල | D |
| | | | | හාලිඇල | D |
| | | | | කන්දෙකැටිය | D |
| | | | | ලුණුගල | D |
| | | | | මීගගකිවුල | D |
| | | | | මහියංගනය | C |
| | | | | පස්සර | B |
| | | | | රිදිමාලියද්ද | D |
| | | | | සොරණාතොට | C |
| | | | | පරණගම | C |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | වැලිමඩ | B |
| | | මොණරගල | C | බිබිල | C |
| | | | | බුත්තල | C |
| | | | | බඩල්කුඹුර | C |
| | | | | කතරගම | D |
| | | | | මැදගම | D |
| | | | | මොණරාගල | B |
| | | | | මඩුල්ල | D |
| | | | | සියඹලාන්ඩුව | D |
| | | | | සෙවනගල | D |
| | | | | තණමල්විල | D |
| | | | | වැල්ලවාය | C |

## ඇමුණුම - 01

| අනු අංකය | කාරණය | | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ස්ථිර පදිංචිය (කාලසීමාව) | අවු. 05 | 05 (උපරිම) |
| | | අවු. 04 | 04 |
| | | අවු. 03 | 03 |
| | | අවු. 02 | 02 |
| | | අවු. 01 | 01 |
| | | අවු. 01ට අඩු | නැත |
| 02 | කලත්‍රයාගේ අභාවය | - | 05 (උපරිම) |
| 03 | කලත්‍රයාගේ රැකියා ස්ථානය (දුර ප්‍රමාණය) | කි.මී.100 හෝ වැඩි | 05 (උපරිම) |
| | | කි.මී. 99 - 80 | 04 |
| | | කි.මී. 79 - 60 | 03 |
| | | කි.මී. 59 - 40 | 02 |
| | | කි.මී. 39 - 20 | 01 |
| | | කි.මී. 19 අඩු | නැත |
| 04 | මාරු මණ්ඩලයේ අභිමතය පරිදි සැළකිල්ලට ගත් විශේෂ කරුණු | නිදන්ගත රෝග,<br>පූර්ණ අබාධිත,<br>සුවකල නොහැකි රෝග,<br>අංශභාගය,<br>රණවිරු පදනම (කලත්‍රයා) | 05 (උපරිම) |
| 05 | ඉතිරි නිවාඩු<br><br>ස්ථාන මාරු ඉල්ලුම් කරන වර්ෂයට පූර්වාසන්නතම වසර 05ක සාමාන්‍යය | 20 හෝ ඊට වැඩි | 05 (උපරිම) |
| | | 19 – 15 | 04 |
| | | 14 – 10 | 03 |
| | | 09 – 05 | 02 |
| | | 04 – 01 | 01 |